# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2329/47 - 2023 අප්‍රේල් මස 28 වැනි සිකුරාදා - 2023.04.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (ඇ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති සමාගමක් වන, ලියාපදිංචි අංක පී. වී. 9729 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2021 ජනවාරි මස 01 වන දින අංක 2208/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන, "අන්තර්ජාතික ආර්ථික විද්‍යාව හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාරවේදී (ගෞරව)" යන සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මඟින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිතව සම්පූර්ණ කළයුතු (SLQF 6 වන මට්ටම) දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයක් ලෙස ඇතුළත්ව ඕනෑම විෂයය ධාරාවක් යටතේ සාමාන්‍ය සාමාර්ථ ("S") තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා රෝයල් ඉන්ස්ටිටියුට් ඔෆ් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය හඳුනාගනු ලැබේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව | බීඑඩ් ගෞරව (දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම) |

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0194/1

---

එල්.ඩී.බී. 21/1978 (ඈ)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25(අ) වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක ජී. එල්. 24 දරන, උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2022 දෙසැම්බර් මස 29 වන දින අංක 2312/47 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන, "ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශනපති උපාධිය" යන සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපාධි වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී අවම අධ්‍යයන සම්භාර 60 ක් සහිතව සම්පූර්ණ කළයුතු (SLQF 10 වන මට්ටම) අධ්‍යාපනපති උපාධිය සම්බන්ධයෙන් සහ අවම අධ්‍යයන සම්භාර 30 ක් සහිතව සම්පූර්ණ කළ යුතු (SLQF 9 වන මට්ටම) ඉගැන්වීම් පාඨමාලාව සහිත අධ්‍යාපනපති උපාධිය සම්බන්ධයෙන් -

   (අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් ලබාගත් අධ්‍යාපනවේදී උපාධියක් ලබා තිබීම.

   (ආ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් ලබාගත් අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (PGDE) සමගින් මූලික උපාධියක් ලබා තිබීම, හෝ

   (ඇ) අවම වශයෙන් වසර දෙකක සේවා පළපුරුද්ද සහිතව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක මූලික උපාධියක් ලබා තිබීම,

   යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. මෙහි II වන උපලේඛනයේ දක්වා ඇති උපාධි වැඩසටහන, ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂාවලින් පැවැත්විය හැක.

3. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පිරිනැමීම සඳහා ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් (SLIIT) ආයතනය පිළිගනු ලැබේ.

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| අධ්‍යාපනපති | එම්ඒඩ් |
| ඉගැන්වීම් පාඨමාලාව සහිත අධ්‍යාපනපති | එම්ඒඩ් (ඉගැන්වීම් පාඨමාලාව සහිත) |

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම.),
අධ්‍යාපන අමාත්‍ය.

2023 අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ දී ය.

EOG 04 - 0194/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.